# ශ්‍රී ලාංකික ජනතාවගේ සහ දේශයේ සෞභාග්‍ය වෙනුවෙන් කැප වී සිටින අප සමඟ හවුල්කරුවකු වන්නට ඔබත් කැමතිද ?

දිවයින පුරා ශාඛා 276 කින් යුත් ශාඛා ජාලයකින් සහ 3000 කට වැඩි ශ්‍රම බලකායකින් යුත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පුරප්පාඩුව ඇති පහත තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද ඇති ප්‍රතිඵල අභිමුඛ දක්ෂ කාර්යශූර පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ප්‍රධාන අවදානම් නිලධාරී (CRO)

බැංකුව මුහුණ දෙන ප්‍රධාන අවදානම් වන ණය, වෙළඳපොල හා මෙහෙයුම් අවදානම මනා ලෙස කළමනාකරණය හා ඒ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත නිරන්තරයෙන් වාර්තා කිරීමට ප්‍රධාන අවදානම් නිලධාරියා වගකිව යුතු වන අතර, අභ්‍යන්තර හා බාහිර නීතින්, රෙගුලාසි හා ප්‍රමිතීන් වලට යටත්ව, අවදානම් හා ප්‍රතිලාභ මනා ලෙස කළමනාකරණය කරමින් ව්‍යාපාරයේ ප්‍රවර්ධනය සිදුවන බවට තහවුරු කළ යුතුය. බැංකුව විසින් මුහුණ දෙන සියලුම අවදානම් හඳුනා ගැනීම, අධීක්ෂණය, පාලනය අවම කිරීම හා වර්තා කිරීම සඳහා වූ සියලුම ප්‍රතිපත්තීන් සැකසීමේ මූලික වගකීම ප්‍රධාන අවදානම් නිලධාරී සතුය.

**ප්‍රධාන වගකීම්**

- එලදායී ව්‍යාපාර වර්ධනයට සහය වීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ හා බැංකුවේ උපායමාර්ගික සැලැස්මේ අවශ්‍යතා සපුරාලන ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් රුචි රාමුව සංවර්ධනය කිරීම සහ යාවත්කාලීන කිරීම.
- තිරසාර වර්ධනයක් අත්කර ගත හැකි ඉහළ සාධනයක් සහ මනාව පාලනය කළ ආයතනයක් ඇති කිරීම සඳහා ආයතනික කළමනාකාරිත්වය හා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමඟ සමීපව කටයුතු කිරීම.
- ආයතනයෙහි අවදානම් කළමනාකරණය කිරීම සඳහා අවදානම් රාමුව අඛණ්ඩව සංවර්ධනය කිරීම, වැඩිදියුණු කිරීම හා ක්‍රියාවලින් අරමුණු සඳහා සුදුසු බව සහතික කිරීම.
- ප්‍රමාණාත්මක හා ගුණාත්මක තක්සේරු කිරීමේ උපාය මාර්ග තුළින් පවතින, නව හා ඇතිවිය හැකි අවදානම් තක්සේරු කිරීම හා ඒවා සඳහා තිරසාර විසඳුම් හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම.
- ආයෝජන ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ තහවුරු කිරීම සඳහා අවශ්‍ය ආයතනික පාලන පද්ධති සහ කමිටු ව්‍යුහයක් ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම.
- බැංකුවේ අවදානම් මට්ටම සහ ව්‍යාපාර ක්‍රියාවලීන් බැංකුවේ අවදානම් රුචිය, බැංකුවේ අභ්‍යන්තර අවදානම් ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණය සඳහා වන නියාමන අවශ්‍යතාවයන්ට අනුකූල බව සහතික කිරීම.
- විශ්වාසදායක හා දැනුවත් අවදානම් සහිත ධනාත්මක අවදානම් කළමනාකරණ සංස්කෘතියක් ඇති කිරීම සඳහා පුහුණු කිරීම, සන්නිවේදනය හා එකඟ වූ / හඳුනාගත් අවදානම් රාමුව ප්‍රවර්ධනය කිරීම.
- ආයතනික කළමනාකරණයේ සාමාජිකයෙකු ලෙස ආයතනයේ වර්තමාන ගැටළු නිරාකරණය, කළමනාකරණය සඳහා අවශ්‍ය උපායමාර්ගයන් සැපයීම සංවර්ධනය හා පවත්වාගෙන යාම.

**සුදුසුකම් හා පළපුරුද්ද**

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග පශ්චාත් උපාධියක් හෝ බැංකුකරණය පිළිබඳ වෘත්තිමය සුදුසුකමක් ලබා තිබීම.

(ආ) ICASL / ICA (England and Wales) / ACCA (UK) / CMA (UK)/(SL)
යන වෘත්තිමය ආයතනයක සාමාජිකත්වයක් ලබා තිබීම.

- ජ්‍යෙෂ්ඨ කළමනාකරණ (සහකාර සාමාන්‍යාධිකාරී) මට්ටමේ වසර 8 ක පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර, ඉන් වසර 03 ක් බැංකු හා මූල්‍ය ආයතනයක අවදානම් / මූල්‍ය / විගණන ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම.
- ණය ඇගයීම සහ අනුමත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ දැනුම සහ ඇති හැකියාව අමතර සුදුසුකමක් වනු ඇත.
- වයස අවුරුදු 57 ට අඩු වීම යෝග්‍ය වේ.

## ප්‍රධාන අභ්‍යන්තර විගණක (CIA)

අභ්‍යන්තර විගණනයේ විෂය පථය තුළ බැංකුවේ ක්‍රියාකාරීත්වයේ අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම සඳහා බැංකුවේ විගණන අත් පොතට අනුකූලව අඛණ්ඩව විගණනය සඳහා විගණන සැළසුම් මාසික / කාර්තුමය වශයෙන් වැඩසටහන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට වාර්තා කිරීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක වගකිව යුතුය.

ක්‍රියාකාරී පිරිවැය එලදායි පාලනයන් ප්‍රවර්ධනය කිරීම සඳහා පිරිවැය අවම කිරීම, සේවා සැපයුම් ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා වන යෝජනා, සොයා ගැනීම්, නිරීක්ෂණ හා නිර්දේශයන් සහිත ස්වාධීන වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

**ප්‍රධාන වගකීම්**

- මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලනයන් කෙරෙහි සුවිශේෂී අවධානය යොමු කරමින් ක්‍රියාකාරීත්වයේ එලදායිතාවය සඳහා කළමනාකරණය විසින් හඳුන්වා දී ඇති අභ්‍යන්තර පාලනයන් සමාලෝචනය කිරීම, බැංකුවේ සියලු අංශ ආවරණය වන පරිදි පුළුල් අභ්‍යන්තර විගණන සැළසුම් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- බැංකුවේ මෙහෙයුම් කටයුතු හා අවදානම් කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇතිකළ හැකි නීති, රෙගුලාසි සහ විනය ක්‍රියාපටිපාටිවලට අනුකූල වීම සඳහා බැංකුවේ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි සමාලෝචනය කිරීම.
- අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලය ඔවුන්ගේ පූර්ණ හැකියාවන් කරා ළඟා වීම සඳහා පුහුණු කිරීම හා සංවර්ධනය කිරීම.
- අවශ්‍ය අවස්ථාවන්හිදී පරීක්ෂණ පවත්වා විගණන කමිටුවට වාර්තා කිරීම.
- විගණන කටයුතු සම්බන්ධයෙන් බාහිර විගණකවරුන්, රාජ්‍ය ආයතන හා වෙනත් රෙගුලාසි සමඟ සම්බන්ධීකරණය කිරීම.
- සම්පත් පිරිමැසුම්දායීව හා කාර්යක්ෂමව යෙදවීම සමාලෝචනය කිරීම, තක්සේරු කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු සාකච්ඡා සඳහා සහය වීම.

**ප්‍රධාන සුදුසුකම් :**

- අවම වශයෙන් පහත සඳහන් එක් වෘත්තිමය ආයතනයක සාමාජිකත්වය ලබා තිබිය යුතුය.
    a. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය
    b. එංගලන්තයේ සහ වේල්සයේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය
    c. එක්සත් රාජධානියේ සහතිකලත් වරලත් ගණකාධිකාරීන්ගේ සංගමය
    d. සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන් (එක්සත් රාජධානිය / ශ්‍රී ලංකාව) හෝ වෙනත් සමාන වෘත්තීය සුදුසුකම්.
- ජ්‍යෙෂ්ඨ කළමනාකරණ (සහකාර සාමාන්‍යාධිකාරී) මට්ටමේ වසර 08 ක පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර, ඉන් වසර 05 ක් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්තව පළපුරුද්දක් ලබා තිබිය යුතුය.
- තොරතුරු තාක්ෂණය පදනම් කරගත් විගණන ක්‍රමවේද පිළිබඳ දැනුම හා අත්දැකීම් තිබිය යුතුය.
- පිරිස් කළමනාකරණය සහ අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ අන්තර් ක්‍රියාකාරීත්වයන් පිළිබඳ තහවුරු කළ හැකි වාර්තා ඉදිරිපත් කළ යුතුය.
- බැංකු ක්ෂේත්‍රයේ ආයතනික යහපාලන පිළිවෙත් සහ අනාවරණ අවශ්‍යතා පිළිබඳව දැනුම සහ අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (IFRS) පිළිබඳ දැනුම සහිත වීම
- වයස අවුරුදු 57 ට අඩු වීම යෝග්‍ය වේ.

2020/10/11 වන දින පළවූ පෙර දැන්වීමට අනුව අයදුම්කරන ලද අයහට ද උනන්දුවක් දක්වන්නේ නම් මේ සඳහා අයදුම් කළ හැකිය.

අභ්‍යන්තර අයදුම්කරුවන් හටද ඉහත තනතුරු සඳහා අයදුම්පත් යොමුකළ හැකි අතර ඔවුන් සඳහා වයස් සීමාව අදාල නොවනු ඇත.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය : 2021 ජූනි මස 04 වන දින

**අයදුම්කරනු ලබන පිළිවෙළ :**

මෙම තනතුරු සම්බන්ධව උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් අයදුම්කරුවන් විසින් අධ්‍යාපනික/ වාත්තිමය සහතිකපත්වල පිටපත් සහිත ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය. එම අයදුම්පතෙහි නම, ලිපිනය, දුරකතන අංකය සහිත ඥතීන් නොවන වෘත්තීමය පුද්ගලයින් දෙදෙනෙකුගේ තොරතුරු ද ඇතුළත් කර එවිය යුතු අතර, තැපැලෙන් යොමු කරන්නේ නම් අයදුම්කරන තනතුර අයදුම්පත්‍රය බහා එවන ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. නැතහොත් එම අයදුම්පත් විද්‍යුත් තැපැල් careers@rdb.lk ඊමේල් ලිපිනයට යොමු කළ යුතුය.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank

සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැලණිය.
0112 42 52 62 | www.rdb.lk